# බුද්ධචරිත වර්ණනයෙහි සාහිත්‍යික ප්‍රවේශය සමතික්‍රමණය පිළිබඳ අධ්‍යයනයක්

## (මහාචාර්ය සුචරිත ගම්ලත්තුන්ගේ 'බුද්ධචරිතය' කෘතිය ඇසුරෙනි)

දිලිනි ආරියවංශ[1]

යම් ආගමක් පිළිබඳ ව තත් ආගම අදහන්නන් තුළ භක්තිය ජනනය කරනු වස් උපයුක්ත ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වනුයේ ආගමික ශාස්තෘවරයා උත්කර්ෂයට නැංවීම යි. මෙහි ලා සාහිත්‍යකරුවා වෙත මූලික වගකීමක් පැවරේ. බුදුදහමෙහි මූලික හරයට සහ ශ්‍රද්ධා සංකල්පයට මෙය පටහැණි නමුදු බුද්ධචරිත වර්ණනයෙහි ලා සාහිත්‍යකරුවන් අතර බහුප්‍රචලිත ව ඇත්තේ මෙම ප්‍රවේශය බව පෙනේ. පෙළ සහ පශ්චාත්කාලීන අටුවා සංසන්දනයෙන් අනාවරණය කර ගත හැක්කේ මෙහි මුල්කාලීන අවස්ථාවකි. වර්තමානයේ ද සාහිත්‍යකරුවන් අතින් සිදු වනුයේ බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යත්වයේ උපරිතලයට නොව, අස්වාභාවික උත්තර තලයකට ඔසවා තැබීම යි.

මහාචාර්ය සුචරිත ගම්ලත්තුන් විසින් රචිත 'බුද්ධචරිතය' ග්‍රන්ථයෙහි පළමු මුද්‍රණය නිකුත් වනුයේ 2006 වර්ෂයේ දී ය. කතුවරයා එහි දී අනුගමනය කරන ප්‍රවේශය, උක්ත ප්‍රවේශයෙන් වෙනස් වූවකි. එසේ වුව ද ඒ පිළිබඳ ව සප්‍රමාණික කතිකාවක් ඇති වූ බවක් නො පෙනේ.බුද්ධචරිතය උත්කර්ෂයට නංවන්නන් ගේ අපේක්ෂාව වනුයේ සහෘදයා තුළ භක්තිය ජනනය කිරීම යි. එසේ වතුදු අප කතුවරයා ගේ අභිලාෂය වී ඇත්තේ බුද්ධචරිතය සාහිත්‍යික වර්ණනා කෙරෙන් බැහැරට ගෙන සහෘදයා අබිමුව තැබීම යි. එය බුදුදහමෙහි මූලික හරය හා ගැළපෙන්නක් ද වෙයි.

ස්වකීය අභිමතාර්ථය සාධනයෙහි ලා කතුවරයා මුල් පෙළ පාදක කර ගනිමින් කරුණු ගෙනහැර දක්වන අතර, ඒ ඒ තැන්වල දී ලලිතවිස්තරය, මහාවස්තුව ආදිය මෙන් ම තිබ්බතීය මූලාශ්‍රය ද ඇසුරු කර ගනිමින් සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කරයි.සිදුහත් කුමරු ගේ උපන්දිනය දැක්වීමේ දී ලලිතවිස්තරයෙහි එන විසදෘශතාව පිළිබඳ ව කෙරෙන විග්‍රහය මෙයට නිදසුනකි. එසේ ම සය වසක් දුෂ්කර ක්‍රියා කිරීමෙන් අනතුරු ව බෝසතාණන් වහන්සේ සිහිසුන් ව වැටීම, එම පුවත දේවතාවකු ශුද්ධෝදනයන් හට දැන්වීම යන කරුණු ඇතුළත් වන්නේ ද පෙළෙහි නොව අටුවාවෙහි බව කතුවරයා දක්වයි. බුදුරජාණන් වහන්සේ සත්සතියක් ගත කිරීම පිළිබඳ පුවත ද පෙළෙහි නොඑන්නක් බව ග්‍රන්ථයෙහි විස්තර වේ. ඒ අනුව, පෙළෙහි ආ සිවුසතිය සත්සතියක් බවට පත් කර ඇත්තේ ජාතක අටුවාව, ලලිතවිස්තරය සහ මහාවස්තුව යි.

මේ ඈ විසින් 'බුද්ධචරිතය' රචනා කිරීමේ දීමහාචාර්ය ගම්ලත්තුන්බුද්ධචරිත වර්ණනයෙහි සාහිත්‍යික ප්‍රවේශය සමතික්‍රමණය කොට ඇත. මෙහි ලා අප ගේ මුඛ්‍යාධ්‍යාශය වනුයේ මෙම නව ප්‍රවේශයෙහි යුක්තියුක්ත භාවය අධ්‍යයනය කිරීම යි.

**ප්‍රමුඛ පදඃ** බුද්ධචරිතය, බුද්ධචරිත වර්ණනය, සුචරිත ගම්ලත්

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
dilini1@yahoo.com